ප්‍රධාන ලේකම්
பிரதான செயலாளர்
Chief Secretary } Tel. 081-2223418, Fax 081-2223418

පොදු අංකය
பொது இலக்கம்
General line } Tel. 081-4953289/90, Fax 081-2239075

විද්‍යුත් තැපැල
மின் அஞ்சல
E-mail } csecp1@gmail.com

වෙබ් අඩවිය
இணையத்தளம
Web site } www.cs.cp.gov.lk

# ප්‍රධාන ලේකම් කාර්යාලය - මධ්‍යම පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மத்திய மாகாணம்
# Chief Secretary's Office - Central Province

තැ.පෙ. 102, ප්‍රධාන ලේකම් කාර්යාලය, මධ්‍යම පළාත් සභා සංකීර්ණය, පල්ලේකැලේ, කුණ්ඩසාලේ
த.பெ.102, பிரதான செயலாளர் அலுவலகம், மத்திய மாகாண சபை கட்டிடத்தொகுதி, பல்லேகலை, குண்டசாலை
P.O Box 102, Chief Secretary's Office, Central Provincial Council Complex, Pallekele, Kundasale

මගේ අංකය / எனது இல / My No } CPC/CS/04/04/CS/LM/2025

ඔබේ අංකය / உமது இல / Your No }

දිනය / திகதி / Date } 2025.11. 06

ලේකම්
ප්‍රධාන හා අධ්‍යාපන/සෞඛ්‍ය/ කෘෂිකර්ම/මාර්ග සංවර්ධන/ කර්මාන්ත අමාත්‍යාංශය, මධ්‍යම පළාත

පළාත් අධ්‍යක්ෂ (ඉංජිනේරු සේවා)
පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව

<u>**ඉදිකිරීම් ව්‍යාපෘති වල ප්‍රමාණ පත්‍ර (BOQ) ප්‍රදර්ශනය කිරීම**</u>

ඉහත කරුණ සම්බන්ධයෙන් මුදල් කොමිෂන් සභාවේ ලේකම් විසින් යොමු කර ඇති අංක FC/PDP/01/01/2025-III හා 2025.06.09 දිනැති ලිපිය හා බැඳේ. එම ලිපියෙහි පිටපතක් අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා මේ සමග අමුණා එවමි.

02. එම ලිපිය මගින් දැනුම් දී ඇති පරිදි මධ්‍යම පළාත් සභාව මගින් සිදු කරනු ලබන එක් එක් ඉදිකිරීම් ව්‍යාපෘති වලට අදාළ තොරතුරු එම ව්‍යාපෘති වල ප්‍රතිලාභීන්ට / පොදු මහජනතාවට පහසුවෙන් අවබෝධ කරගත හැකි පරිදි වැඩබිම් වල ප්‍රදර්ශනය කිරීම සඳහා උපයෝගී කරගැනීමට, මාර්ග ඉදිකිරීම් ව්‍යාපෘතියක් ආදේශ කොටගෙන සකස් කරන ලද ආදර්ශ ආකෘති පත්‍රයක පිටපතක් මේ සමග ඔබ වෙත යොමු කරමි.

03. ඒ අනුව, එම ආදර්ශ ආකෘතිය පාදක කරගෙන ඔබ ආයතය මගින් සිදු කරනු ලබන එක් එක් ව්‍යාපෘතියට ගැළපෙන පරිදි ආකෘති පත්‍ර සකස්කර ඉදිකිරීම් අඩවි (Construction Site) වල ප්‍රදර්ශනය කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

අත්සන් කළේ - ජී. එච්. එම්. ඒ. ප්‍රේමසිංහ
ප්‍රධාන ලේකම්
මධ්‍යම පළාත

ඉංජි. ඩබ්. එම්. අයි. එස්. කේ. විජේකෝන්
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා)

o/c

# මහජන ප්‍රදර්ශනය සඳහා - මාර්ග ඉදිකිරීම් ව්‍යාපෘති තොරතුරු

ව්‍යාපෘතියේ අරමුණ - ( ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු සඳහන් කරන්න)

## 1. සාමාන්‍ය තොරතුරු

| | |
|---|---|
| ව්‍යාපෘතියේ නාමය | [මාර්ගයේ / ව්‍යාපෘතියේ නාමය] |
| ස්ථානය | [ගම / නගරය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, දිස්ත්‍රික්කය] |
| කොන්ත්‍රාත් අංකය | [කොන්ත්‍රාත් අංකය] |
| ව්‍යාපෘතියේ ආරම්භක දිනය | [වර්ෂය / මාසය / දිනය] |
| අවසන් කළයුතු දිනය | [වර්ෂය / මාසය / දිනය] |
| කොන්ත්‍රාත් ගිවිසුමේ කාලසීමාව | [වර්ෂ /මාස / දින] |
| අරමුදල් සපයන ආයතනය | [උදා: රජය, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව] |

## 2. ව්‍යාපෘතිය (ඇස්තමේන්තුවට ඇතුළත් ප්‍රධාන වැඩ කොටස්)

- [උදා: කි.මී. 2.5ක බොරළු මාර්ගයක් ඉදිකිරීම (නිසි ජලාපවහනය සහ මාර්ග උරහිස් (Shoulders) පළල් කිරීම ඇතුළුව]
- [බිටුමිනස් මතුපිටක් සහිත මීටර් 4.0 පළල මාර්ගයක් ඉදිකිරීම]
- [අවශ්‍යතාවය පරිදි බෝක්කු හා අපවහන පද්ධති ඉදිකිරීම]

## 3. කොන්ත්‍රාත් ප්‍රදානය පිළිබඳ තොරතුරු

| අයිතමය | විස්තරය |
|---|---|
| ලැබුණු මුළු ලංසු ගණන | [xx] |
| තෝරාගත් ලංසුකරුගේ නම | [කොන්ත්‍රාත්කරුගේ නම] |
| ව්‍යාපාර ලියාපදිංචි අංකය | [ලියාපදිංචි අංකය] |
| මුළු කොන්ත්‍රාත් වටිනාකම | රු. [xx,xxx,xxx.xx] (වැට් සහිතව) |
| කොන්ත්‍රාත්තුවේ වර්ගය | [උදා: ඒකක රේටය (Unit Rate) වශයෙන් හෝ සම්පූර්ණ ව්‍යාපෘතිය සඳහා ස්ථාවර / නිශ්චිත ගාස්තු (Lump Sum) ගෙවීම වශයෙන් ගෙවීම් සිදු කරන ආකාරය අනුව] |
| ප්‍රසම්පාදන ක්‍රමය | [උදා: ICB, NCB, ෂොපින්] |

## 4. ඇස්තමේන්තුගත ප්‍රධාන ද්‍රව්‍ය ප්‍රමාණ

| ද්‍රව්‍යය | ප්‍රමාණය | ඒකකය |
|---|---|---|
| සිමෙන්ති | [xxx] | බෑග් |
| මැටල් (ඇග්‍රිගේට්) | [xxx] | කියුබික් මීටර් |
| වැලි | [xxx] | කියුබික් මීටර් |
| බිටියුමන් | [xxx] | ලීටර් / ටොන් |
| බිම සැකසීම / ABC | [xxx] | කියුබික් මීටර් |

| ද්‍රව්‍යය | ප්‍රමාණය | ඒකකය |
|---|---|---|
| 6'' x 9'' කළුගල් | [xxx] | කියුබික් මීටර් |
| වෙනත් | [xxx] | [xxx] |

5. ව්‍යාපෘතියේ විස්තර

| අයිතමය | විස්තරය |
|---|---|
| මාර්ගයේ පළල | [උදා: 4.0 මීටර්] |
| මාර්ග උරහිස් (Shoulders) | [උදා: 0.5 මීටර් - දෙපසම] |
| ජලාපවාහන ව්‍යුහය | [උදා: 600mm විෂ්කම්භයෙන් යුතු බෝක්කු 3 ක්] |
| වෙනත් වැඩ | [උදා: මාර්ග සංඥා, ආරක්ෂිත බාධක, පැති බැමි] |

6. ව්‍යාපෘති තොරතුරු

| භූමිකාව | කොන්ත්‍රාත් තොරතුරු |
|---|---|
| සේවාදායකයා / ව්‍යාපෘති හිමිකරු | [උදා: ආයතනයේ නම උදා: පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය] |
| ඉංජිනේරු / අධීක්ෂණ නිළධාරි | [නම සහ තනතුර] |
| ග්‍රාම නිලධාරී කොට්ඨාසය | [ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නම] |

මහජන විමසීම් සඳහා සම්බන්ධ කරගැනීමට දුරකථන: [xxxxxxx] / ඊමේල්: [example@mail.com]

6. ව්‍යාපෘති ප්‍රගතිය හා මහජන දැනුවත් කිරීම් (Public Notice)

- *"[දිනට] ව්‍යාපෘතියෙහි භෞතික ප්‍රගතිය ආසන්න වශයෙන් [xx]% විය යුතුය."* වශයෙන් අපේක්ෂිත ප්‍රගතිය සම්බන්ධයෙන් මහජනයා දැනුවත් කිරීම.
- ව්‍යාපෘතිය සම්බන්ධව පවතින අක්‍රමිකතා හෝ පැමිණිලි සම්බන්ධයෙන් වාර්තා කිරීමට ප්‍රජාව දිරිමත් කිරීම. *(මේ සම්බන්ධයෙන් අවශ්‍ය සම්බන්ධීකරණය සිදු කරගැනීම සඳහා අවශ්‍ය තොරතුරු කරුණු අංක 6 මගින් ලබාදෙනු ලැබේ.)*
- මෙම ව්‍යාපෘතිය ප්‍රදේශවාසීන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම උදෙසා ක්‍රියාත්මක කරනු ලබන බව හා එමගින් මහජන සම්බන්ධතාවය සඳහා ප්‍රවේශ පහසුකම් වැඩිදියුණු වන බවට මහජනතාව දැනුවත් කිරීම.

ප්‍රදර්ශනය සඳහා අනුමත කළේ:

නම :
තනතුර :
ආයතනය :
දිනය: [වර්ෂය / මාසය / දිනය]

මුදල් කොමිෂන් සභාව
நிதி ஆணைக்குழு
FINANCE COMMISSION
(Established under Article 154 "R" of the Constitution)

03, සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව.
03, சரண மாவத்தை, ராஜகிரிய, இலங்கை.
03, Sarana Mawatha,
Rajagiriya, Sri Lanka.

මගේ අංකය / எனது இல. / My No. FC/PDP/01/01/2025-III

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2025.06.09

ප්‍රධාන ලේකම්
බස්නාහිර / මධ්‍යම / දකුණු / උතුරු / වයඹ / උතුරු මැද / ඌව / සබරගමුව / නැගෙනහිර පළාත

**ඉදිකිරීම් ව්‍යාපෘතිවල ප්‍රමාණපත්‍ර (BOQ) ප්‍රදර්ශනය කිරීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ වෙත යොමු කරන ලද මාගේ අංක FC/PDP/01/01/2025-II හා 2025.05.05 දිනැති ලිපියට වැඩිමනත් වශයෙනි.

02. ඉදිකිරීම් ව්‍යාපෘතිවලට අදාළ තොරතුරු ප්‍රදර්ශනය කිරීමෙන් අපේක්ෂා කරනු ලබන්නේ අදාළ ප්‍රතිලාභීන් ඉදිකිරීම් කටයුතු පිළිබඳව විමසිලිමත්ව සිටීමට පෙළඹවීමත් ඒ තුළින් එම කටයුතු සඳහා ඔවුන්ගේ සහභාගීත්වය ලබා ගැනීමත්ය. එබැවින් ඉංජිනේරු ඇස්තමේන්තුවල (ප්‍රමාණ පත්‍ර) සඳහන් තොරතුරු උනන්දු කණ්ඩායම්වලට හා පොදු මහජනතාවට පහසුවෙන් අවබෝධ කර ගත හැකි ආකාරයට සරලව ප්‍රදර්ශනය කිරීම වැදගත්ය. ඒ තුළින් ග්‍රාමීය ජනතාවට එම ව්‍යාපෘතිවල ගුණාත්මකභාවය පිළිබඳව විමසිලිමත් වීමට වඩාත් පහසු වේ. ගුණාත්මකභාවයෙන් යුතු ප්‍රමිතියට ඉදිකරන ලද අවසන් නිමැවුමක් නිර්මාණය කිරීම සඳහා විමසිලිමත්ව සිටීමේ සංස්කෘතියක් (Monitoring Culture) එමඟින් ඇතිකර සංවර්ධන කටයුතු සඳහා ප්‍රතිලාභීන්ගේ සහභාගීත්වයද ලබා ගැනීමට අපේක්ෂා කෙරේ.

03. ඒ අනුව, ඉදිකිරීමට අදාළ ප්‍රධාන කාර්යයන් මොනවාද, එම එක් එක් කාර්යය සඳහා ඇස්තමේන්තුගත ද්‍රව්‍ය ප්‍රමාණයන් කොපමණද (සිමෙන්ති, වැලි, ගල්, කම්බි ආදී) හා අපේක්ෂිත නිමැවුමෙහි විශාලත්වය කොපමණද (දිග, පළල, උස ආදී) වැනි තොරතුරු පැහැදිළිව හා සරලව ප්‍රදර්ශනය කිරීම සුදුසු අතර ඒ තුළින් පහසුවෙන් අවබෝධ කර ගත නොහැකි තාක්ෂණික තොරතුරු නිසා ඇතිවිය හැකි ගැටළු වලක්වා ගත හැකි බවද කාරුණිකව සඳහන් කරමි.

04. 2025.05.22 වන දින පැවැත් වූ ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභා රැස්වීමෙහි ද ප්‍රමාණ පත්‍ර ප්‍රදර්ශනය කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදුව එම කොමිෂන් සභාවේ උපදේශයන්ද එහි මහ ලේකම්වරයා විසින් මා වෙත දන්වා එවා ඇත.එම ලිපියේ පිටපතක්ද මේ සමග අමුණා ඇත. එහි සඳහන් කර ඇති පරිදි, අංක 8.8 දරණ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව කටයුතු කිරීමේ අවශ්‍යතාවය ද කාරුණිකව පෙන්වා දෙනු කැමැත්තෙමි.

ඒ.ටී.එම්.යූ.ඩී.බී. තෙන්නකෝන්
ලේකම්
මුදල් කොමිෂන් සභාව

පිටපත්:

| | |
|---|---|
| 1. ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය | - කරු.ඔබගේ දැනගැනීම පිණිස |
| 2. ලේකම්, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | - කරු.ඔබගේ දැනගැනීම පිණිස |
| 3. මහලේකම්, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව | - කරු.ඔබගේ දැනගැනීම පිණිස |
| 4. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්), සියලුම පළාත් | - කරු. අ.ක.ස. |
| 5. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය), සියලුම පළාත් | - කරු. අ.ක.ස. |
| 6. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු), සියලුම පළාත් | - කරු. අ.ක.ස. |

සභාපති / தலைவர் / Chairman (+94)011 2866724
ලේකම් / செயலாளர் / Secretary (+94)011 2866824
කාර්යාලය / அலுவலகம் / Office (+94)011 2866747
ෆැක්ස් / தொலைநகல் / Fax (+94)011 2866679
වෙබ් අඩවිය / இணையத்தளம் / Website www.fincom.gov.lk
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail info@fincom.gov.lk

K0463

ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව
தேசிய பெறுகை ஆணைக்குழு
# National Procurement Commission

| මගේ අංකය<br>எனது இலக்கம்<br>My Number | NPC/PP/01/CL-146/2025 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your Number | FC/PDP/01/01/2025 | දිනය<br>திகதி<br>Date | 03 .06.2025 |
|---|---|---|---|---|---|

05 JUN 2025

Secretary
Finance Commission

**Display of Bills of Quantities (BOQ) of Construction Activities**

This has reference to your letter dated 05th May 2025 regarding the above subject matter.

2. We hereby inform you that the National Procurement Commission ("NPC") has discussed the contents of the aforementioned letter at the Commission Meeting held on the 22nd of May 2025 wherein it was decided to inform you that;

*"1. The BOQ is an integral part of the bidding documents and is highly technical. The contents may be challenging for the general public to comprehend, and individuals who acquire this information may not be well-versed in the subject, potentially leading to unnecessary issues at construction sites.*

*2. The Right to Information Act already allows any party wishing to obtain such information to do so.*

*3. Section 8.8 of the Procurement Guidelines mandates the publication of relevant information pertaining to procurement activities. As per Section 8.8 of the Procurement Manual requires the publication of the following:*
- *Description of the items/works/services for which bids/proposals were invited*
- *Total number of bids/proposals received*
- *Name of the successful bidder*
- *Contract price*
- *Details of the local agent in the case of a contract awarded to a foreign bidder*

*It would be more appropriate to display this information in the form of a notice at the construction site for the general public's awareness.*

*4. It is also appropriate to inform relevant parties about these observations from the National Procurement Commission if deemed necessary."*

**D.C. Siribaddana**
**Secretary General**
**National Procurement Commission**

Coppies
01. Secretary to the President, Presidential Secretariat – for information pls.
02. Secretary to the Treasury, General Treasury – for information pls.


ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව, අංක 44 (B90), ආර්. ජී. සේනානායක මාවත, කොළඹ 07.
தேசிய பெறுகை ஆணைக்குழு, இலக்கம் 44(B90), ஆர். ஜீ. சேனாநாயக்க வீதி, கொழும்பு 07.
National Procurement Commission, No 44 (B90), R.G. Senanayaka Mawatha, Colombo 07.

| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2665152 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011-2665162 | විද්‍යුත් තැපෑල<br>மின்னஞ்சல்<br>E-mail | nprocom.gov.lk | වෙබ් අඩවිය<br>இணையத்தளம்<br>Web Site | |
|---|---|---|---|---|---|---|---|